# 2021කාන්තා දින සැමරුම.

"නායකත්වයෙහි කාන්තාව" තේමාව කරගත් 2021/03/08 දිනට යෙදුන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දිනය සමරමින් වැඩසටහන් කිහිපයක් ගරු අමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී.

- කම්කරු දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා බාල දක්ෂිකා සංවිධානය සමඟ අත්වැල් බැඳගනිමින් බාලදක්ෂිකාවන් වෙත කම්කරු නීතිය පිළිබඳව දැනුම ලබා දීම තුළින් සමාජය දැනුවත් කිරීම සහ ඔවුන් සවිබල ගැන්වීම සඳහා විශේෂ අරමුණු ඉලක්ක කරගනිමින් දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා ලාභී හා රැකියා අපේක්ෂිත පුද්ගලයන්ගේ රැකියා ජීවිතයට පිටුවහලක් වනු පිණිස උපදෙස් මාලාවක් අන්තර්ගත "රැකියා වාර්තාව" නමින් අත්පොතක් හඳුන්වා දීම.

- කම්කරු නීති අනපනත් අතර ගැටෙමින් කාර්යාලීය ජීවිතය ගතකරන කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන්ගේ මානසික සුවතාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රවීණ මනෝ විද්‍යා උපදේශිකා අමා දිසානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් කාන්තා ධාරිතා සංවර්ධන සංගීතමය වැඩසටහනක් පැවැත්වීම.

- කම්කරු දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන කටුනායක හා කොග්ගල කාන්තා නේවාසිකාගාරවල නේවාසිකාවන් සඳහා 2021.02.04 හා 2021.03.07 දිනයන්හි සංගීත චිකිත්සාවෙන් මනස සැහැල්ලු කිරීමේ අරමුණින් වැඩසටහන් 02ක් පැවැත්වීම.


























